# 12 . ඓතිහාසික, පුරා විද්‍යාත්මක හා සංචාරක ආකර්ශනිය ස්ථාන

- **කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ වූ ඓතිහාසික වටිනාකමක් සහිත ආගමික සිද්ධස්ථාන**
  - **ගංගාරාම විහාරස්ථානය**




ශ්‍රී ලාංකික ගෘහ නිර්මාණ ශිල්පයට අමතරව, ඉන්දියානු, තායිලන්ත හා චීන යන රටවල වාස්තු ලක්ෂණද දක්නට ලැබෙන කොළඹ පිහිටි ගංගාරාම විහාරය නගරයේ වූ වැදගත් බෞද්ධ පුදබිමක් වේ. විහාරයේ වාස්තු ලක්ෂණ සැලකීමේදී ප්‍රධාන වශයෙන් ශ්‍රී ලාංකික ගෘහ නිර්මාණ ශිල්පය කැපී පෙනුනද ඉන්දියානු, තායිලන්ත හා චීන යන රටවල වාස්තු ලක්ෂණද මෙහි දැක ගත හැකිය.

සෞම්‍ය හා රමණීය භූමියක පිහිටි මෙම විහාරයේ සමහර ඉදිකිරීම් බේරෙ වැව මතුපිටට වන්නටද ඉදිකොට තිබේ. විහාරස්ථානයේ මූලිකාංග ලෙස චෛත්‍යය (දාගැබ), බෝධිය, විහාර මන්දිරය, සීමා මාලකය සහ ධාතු මන්දිරය දැක ගත හැකියි. තවද කෞතුකාගාරයක්, පුස්තකාලයක්, තෙමහල් පිරිවෙනක්, අධ්‍යාපන ශාලාවක් සහ දාන ශාලාවක්ද විහාර භූමියේ ඉදි කොට පවතී.

විහාරයේ කැපී පෙනෙන වාස්තු ඉදි කිරීමක් වූ සීමා මාලකයේ නිර්මාණ කටයුතු සිදු කර ඇත්තේ ජෙෆ්රි බාවා විසිනි. 19 වන සියවසේ ප්‍රසිද්ධ නාවුක වෙළෙන්දෙකු වූ දොන් බැස්ටියන් (ද සිල්වා ජයසූරිය ගුණවර්ධන) මුදලි විසින් මාතර ශ්‍රී ධර්මාරාම නාහිමියන්ට විහාරස්ථානයක් ඉදිකිරීම සඳහා මෙම ඉඩම මිලට ගෙන විශාල වියදමක් දරා භූමිය සකස් කොට දාගැබ, මකර තොරණ සහ ප්‍රවිෂ්ඨ දොරටුවේ සඳකඩ පහන ඉදිකරන ලදී. විහාරයේ රෝපිත, අනුරාධපුර ශ්‍රී මහා

බෝධියේ අංකුරයක් වූ බෝධීන් වහන්සේද රෝපනය කොට ඇත්තේද මෙම මුදලිතුමා විසිනි. මීට අමතරව තෙමහල් දම් සභයක් හා විහාරය වටා වැටක්ද ඔහු විසින් ඉදි කෙරිණි.



## කොටහේන දීපදූප්තමාරාමය

ශ්‍රී ලාංකේය බෞද්ධ ඉතිහාසය ගොඩනැගූ විහාරස්ථානයකි. 1785 දී මුලින් ඉදිකරන ලද දීපදූත්තාරාමය කොළඹ ප්‍රථම බෞද්ධ විහාරය වූ අතර එය පූජ්‍ය නාහිමියන්ගේ නිවහන විය. සුප්‍රකට 'පානදුර වාදයේ' නායක, මහා කථිකයකු වූ මිගෙට්ටුවත්තේ ශ්‍රී ගුණානන්ද හිමි. බෞද්ධ කොඩිය ප්‍රථම වරට නිර්මාණය කර ඔසවන ලද ස්ථානය සහ 20 වන සියවසේ මුල් භාගයේ සිට තායි රාජකීය පරම්පරාවේ පරම්පරාවන් වන්දනාමාන කර තෑගි සහ පරිත්‍යාග ප්‍රදානය කළ විහාරස්ථානය එයයි.

ලන්දේසි සමයේදී බෞද්ධයින්ට කැලණියට හෝ කෝට්ටේට ගොස් වන්දනාමාන කිරීමට සිදු වූ විට එම ප්‍රදේශය තුළ විහාරස්ථානයක් ඉදිකිරීමට ලන්දේසි බලධාරීන් අනුමැතිය නොදීම නිසා මෙම විහාරය ඉදිකර ඇත. කෙසේ වෙතත්, තම නිවසේ දිගුවක් ලෙස පන්සලක් ඉදිකිරීමට අවසර දෙන ලෙස ලන්දේසි ආණ්ඩුකාර වොන් එංගල් බෙක්ට ඒත්තු ගැන්වීමට මුදලියාර් තාබෲ උබයකුලතුංග විජේසිරිවර්ධන සමත් විය. උන්වහන්සේ අලුතින් ඉදිකරන ලද විහාරය උන්වහන්සේට පූජා කළහ. සීනිගම ධම්මරක්ඛිත හිමි. ඒ දීපදූත්තාරාමයේ අසිරිමත් දවස් ය. ඉන්දියාවේ ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ ශාඛාවක් එම ස්ථානය භාරව සිටි මහන්ත මහතාගෙන් සාකච්ඡා කර 18 වැනි සියවසේ අගභාගයේදී විහාරස්ථානයේ රෝපණය කරන ලද අතර එය කොළඹ බොහෝ බෞද්ධයන්ගේ වන්දනා ස්ථානයක් බවට පත්විය.

## මාලිගාකන්ද විද්‍යොාදය පිරිවෙන

1873 දී පූජ්‍ය හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමිපාණන් විසින් ආරම්භ කරන ලද, එවකට ශ්‍රී ලංකාවේ දේශීය අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානයක් වූ මාලිගාකන්දේ විද්‍යෝදය පිරිවෙණ වත්මන් විශ්වවිද්‍යාලයේ ආරම්භක අවස්ථාව විය. 1958 දී (1958 අංක 45 දරන විද්‍යෝදය හා විද්‍යාලංකාර විශ්වවිද්‍යාල පනත, දෙසැම්බර් 15) විශ්වවිද්‍යාලයක තත්ත්වයට උසස් කරන ලද එම ආයතනය "ශ්‍රී ලංකා විද්‍යෝදය විශ්වවිද්‍යාලය" වශයෙන් 1959 පෙබරවාරි 18 දින සිට අධ්‍යයන කටයුතු ඇරඹිණ.





## කොච්චිකඩේ පල්ලිය

ශ්‍රී ලංකාවේ ප්‍රධානත ම නත්තල් දේව මෙහෙයක් සිදු කරන පල්ලියක් ලෙසත්: කතෝලික, බෞද්ධ, හින්දු, මුස්ලිම් සියලු ආගම්වල බැතිමතුන් තම ගැටලු දෙවියන්ට පවසා සහනයක් ලබා ගන්නා ස්ථානයක් ලෙසත් කොච්චිකඩේ ශාන්ත අන්තෝනි දේවස්ථානය වැදගත් වෙනවා. එහි මැදියම් රෑ නත්තල් දේව මෙහෙයට විශාල බැතිමතුන් පිරිසක් සෑම වසරක ම එක්රොක් වෙනවා.

මේ පල්ලිය ප්‍රකටව තිබෙන්නේ කතෝලික, බෞද්ධ ,හින්දු, මුස්ලිම් සියලු ආගම්වල බැතිමතුන් තම ගැටලු දෙවියන්ට පවසා සහනයක් ලබාගන්නට එන ස්ථානයක් ලෙස යි. මේ නිසා 2019 පාස්කු බෝම්බ ප්‍රහාරයෙන් පල්ලියේ ආගමික වතාවත්වලට පැමිණි සිටි මේ ආගම් සියල්ලට ම අයත් පුද්ගලයන් රාශියකට ජීවිතය අහිමි වුණා.

කොළඹ කොච්චිකඩේ ප්‍රදේශය කිතුණු බැතිමතුන්ගෙන් පමණක් නොව බුදුනු, මුස්ලිම් සහ හින්දු බැතිමතුන්ගෙන් ද පිරී පැවතීම සාමාන්‍ය දෙයක් . එයට හේතුව ශාන්ත අන්තෝනි දේවස්ථානය වන්දනා කර, බාරහාර වීමට සෑම ආගමක ම බැතිමතුන් එහි පැමිණෙන නිසා යි. එය ආගමික සහජීවනයට ජීවමාන සාක්ෂි සපයන කේන්ද්‍රස්ථානයක් ලෙස සැලකෙනවා. බොහෝ දෙනෙක් විශ්වාස කරන්නේ තමන්ගේ ගැටලුවලට ශාන්ති අන්තෝනි මුනිඳුන්ගේ පිහිට ලැබෙන බවයි.

බැතිමතුන්ට ඉටිපන්දම් ඇතුළු පූජා ද්‍රව්‍ය විකුණන ස්ථාන රාශියක් ද දේවස්ථානය ඉදිරිපිට පිහිටා තිබෙනවා. කොච්චිකඩේ පල්ලිය වැඳ පුදා ගැනීමට ශ්‍රී ලංකාවේ දුරබැහැරවලින් පවා කතෝලිකයන් පැමිණීම සිරිතක්. මෙම පල්ලිය බොහෝ දෙනාගේ ප්‍රාර්ථනා ඉෂ්ට කරන ආශ්චර්යමත් පුදබිමක් බවයි බැතිමතුන්ගේ විශ්වාසය.

ක්‍රිස්තු වර්ෂ 1505 දී පෘතුගීසීන් ලංකාවට ගොඩබැසීමත් සමඟ ම කතෝලික දහම මුහුදුබඩ පළාත්වල ව්‍යාප්ත කිරීම සිදු වුණා. පල්ලි ඉදි කළා. අනතුරු ව 1658 දී ඕලන්ද ආක්‍රමණයත් සමඟ පෘතුගීසීන්ට මෙරටින් ඉවත් ව යාමට සිදුවුණා. ඕලන්ද පාලන සමයේ රෙපරමාදු ක්‍රිස්තියානි ආගම ඇදහීම නිසා මෙරට කතෝලික

දහම දේශනා කිරීම දඬුවම් ලැබෙන වරදක් වුණා. වර්ෂ 1687 දී ජුසේවාස් මුනිතුමා මන්නාරමින් හොර රහසේ ලංකාවට එන්නේ කිතුදහම නැවත මෙරට ව්‍යාප්ත කිරීමට යි.

ඉන් කලකට පසු මෙරටට දකුණු ඉන්දියාවේ කොචින් සිට තවත් කතෝලික පියනමක් පැමිණෙනවා. ඔහු අන්තෝනියෝ කොච්චියාල්. ඕලන්දයන්ට හොර රහසේ ම කොළඹට පැමිණ මැලිබන් වීදියේ (කොළඹ මාළු වෙළෙඳපොළ ඒ කාලයේ තිබුණේ එතැනයි) මාළු වෙළෙන්දකුගේ නිවසේ නතර වෙනවා. ඉන් පසු මාළු වෙළෙන්දකු විදිහට වෙස්වලාගෙන ඒ අවට පදිංචි ව සිටි ධීවර කර්මාන්තය කරන කතෝලික බැතිමතුන් රාත්‍රී කාලයේ රහසේ හමුවී ඔවුන්ගේ ආගමික කටයුතු ඉටුකර දීම සිදු කළා. ටික කලක් ගතවන විට කතෝලිකයන් විශාල ප්‍රමාණයක් පියනම හමුවීමට පැමිණෙන්න පටන් ගන්නවා.

මෙම පියනම පිළිබඳ ව ඕලන්ද පාලකයන්ට ආරංචි වී ඔහු අත්අඩංගුවට ගෙන තිබෙනවා. ටික කලකට පසු පසු පියනම ඕලන්දයන්ගෙන් මිදී පලා විත් මෝදරට නුදුරු මුහුදුබොඩවත්ත නම් ප්‍රදේශයේ කතෝලික, බෞද්ධ සහ හින්දු ජනකොටස් අතර වාසය කරනවා. මුහුදුබොඩ වත්තේ පියනම වෙස්වලා ගෙන කුඩා පොල් අතු කඩයක් ආරම්භ කර රාත්‍රියේ දේවමෙහෙයන් සිදු කළ බව සමහර ජනප්‍රවාදවල සඳහන් වෙනවා. කලක් යනවිට දහවල් කාලයේද එහි දිව්‍ය පූජා පැවැත්වීම සිදු වුණා.

අන්තෝනි කොච්චියාලාගේ කුඩා පොල්අතු කඩය මුලින් කොච්චියාලේ කඩය යනුවෙන් හඳුන්වා පසුව ඒ පෙදෙසත් කොච්චිකඩේ යනුවෙන් හැඳින්වෙන්නට වූ බවයි පැවසෙන්නේ.

කොච්චිකඩේ දේවස්ථානය පිහිටා ඇත්තේ බටහිර කොටහේන ග්‍රාම නිලධාරි වසමේ කොළඹ වරායට ආසන්න ව යි. 1796 දී මුහුදුබඩ පළාත් ඉංග්‍රීසින් සතු වන අතර ඉන් පසු කතෝලික ආගමට රාජ්‍ය අනුග්‍රහය යළිත් හිමි වෙනවා. වර්ෂ 1806 දී එතෙක් පැවති තාවකාලික පොල් අතු ගොඩනැඟිල්ල වෙනුවට මෙම ස්ථානයේ ස්ථිරව කුඩා දේවස්ථානයක් ඉදි කෙරුණා.

1822 දී බැතිමතුන් කණ්ඩායමක් ඉන්දියාවේ ගෝවට ගොස් ශුද්ධ වූ අන්තෝනි මුනිතුමන්ගේ ප්‍රතිමාවක් ගෙනැවිත් පැරණි දෙව්මැදුරේ අල්තාරය මත පිහිටුවා දෙව්මැදුර අන්තෝනි මුනිවරයා නමින් කැපකර තිබෙන බව සඳහන් වෙනවා.

ඉංග්‍රීසි පාලන සමයේ වර්ෂ 1822 දී සහ 1826 දී මෙම දේවස්ථානය වඩාත් විශාල කර ඉදි කර තිබෙනවා. අද අප දකින ඉදිරිපස කොටස පල්ලියට එක් කර තිබෙන්නේ 1834 දි යි. දේවස්ථාන මුහුණත අලංකාර අයුරින් නිම කර තිබෙනවා. එහි මුහුණතේ ආරුක්කු හැඩැති දිගැටි වීදුරු කුටියක ශාන්ත අන්තෝනි මුනිඳුන්ගේ ප්‍රතිමාවක් තැන්පත් කර තිබෙනවා. එය පුරාවිද්‍යාත්මක වටිනාකමක් සහිත ස්මාරකයක් ලෙසත් වැදගත්.

මුදුන් කොත්, බීරළු වැට, ඩොරික් කුලුනුවලින් සමන්විත යි. මුහුණත දෙපසින් චතුරස්‍රාකාර සීනු කුලුනු දෙකක් දැකගත හැකි යි. පහත භාගයේ දොරටු හා ජනේල ආරුක්කු ආකාරයට සකසා ඇත්තේ ගොතික් සම්ප්‍රදායට අනුව යි. දේවස්ථානයේ ඉතිහාසය පවසන කුඩා කෞතුකාගාරයක් ද මෙහි තිබෙනවා.

ශ්‍රී ලාංකික කතෝලිකයන් අතර වඩාත් ජනප්‍රිය සහ භක්ත්‍යාදරයට ලක්වන ශුද්ධවන්තයකු ලෙස ශුද්ධ වූ ශාන්ත අන්තෝනි මුනිතුමන් සැලකෙනවා. ක්‍රිස්තු වර්ෂ 1195 අගෝස්තු මස 15 වැනි දා පෘතුගාලයේ බටහිර ප්‍රදේශයේ උපන් අන්තෝනි මුනිතුමන්ගේ පියා මාටින් අලේෆොන්සස් බග්ලියොන් වන අතර මව ආනා තෙරේසා ට්‍රැවේරා යි.

ඔහුගේ මුල් නම පර්ඩිනන්ඩ් බුලියන්. උසස් පවුලක උපන් බුලියන් තම දේපළ සහ වෙනත් සැප සම්පත් අත්හැර ජේසුතුමන්ගේ අනුගාමිකයෙක් බවට පත් වුණා. ඔහු පසු ව ප්‍රැන්සිස්කානු නිකායට ඇතුළත් වූ අතර එහි දී අන්තෝනි යන නම ලැබුණා. යොවුන් වියේදී සාන්ත අගස්තීනු තාපසාරාමයකට ඇතුළු වූ බුලියන් තාපසවරයකු වශයෙන් එහි ආධ්‍යාත්මික පුහුණුව ලබනවා.

පසුකාලයක ප්‍රැන්සිස්කානු තාපස පිරිසක් සමඟ තුර්කියට ගොස් එහි කිතු දහම පැතිරවීම ආරම්භ කර තිබෙනවා. ටික කලකින් ම රෝගාතුරවීම නිසා, ඉතාලියට පැමිණි අන්තෝනි මුනිතුමා පාදුවා නගරය තම මූලස්ථානය කරගෙන කිතු දහම දේශනා කිරීම අරඹනවා. වැඩිකල් ජීවත් නොවූ මේ මුනිතුමාක්‍රිස්තු වර්ෂ 1231 දී ස්වර්ගස්ථ වෙනවා. ස්වර්ගස්ථ වී වසරක් ඇතුළත, අන්තෝනි මුනිතුමන් ශුද්ධවන්තයකු ලෙසට පිළි ගත් බව කතෝලික සභාව ප්‍රකාශයට පත්කරනවා.

කතෝලික බැතිමතුන් විශ්වාස කරන්නේ දේව වරමින් ප්‍රාතිහාර්යය කිරීමේ බලය ද අනාවැකි පළකිරීමේ හැකියාව ද අන්තෝනි මුනිතුමන් සතු බව යි. දුප්පතුන්ගේ ශාන්තුවරයා යන නාමයෙන් ද ඔහු හැඳින්වෙනවා. කොච්චිකඩේ පල්ලියට තම දුක්ගැනවිලි ඉදිරිපත් කිරීමට පැමිණෙන ජනතාවගෙන් බහුතරයක් දුප්පතුන් වෙනවා. ධීවරයන් අතරත් මේ මුනිවරයා ඉතා ජනප්‍රිය යි. අන්තෝනි මුනිතුමන් නැති වූ දේවල් සොයා දෙන සහ බලාපොරොත්තු සුන්වූ අවස්ථාවලදී පිහිට වන මුනිවරයා ලෙසයි ප්‍රකට ව ඇත්තේ.

1995 ජනවාරි 20 දින මෙරටට වැඩම කළ දෙවන ජුවාම් පාවුලු පාප්තුමන් කටුනායක ගුවන් තොටුපොළ සිට විවෘත රථයකින්, ගාලු මුවදොර පිටියේ පැවැත්වූ පිළිගැනීමේ උත්සවයට පැමිණෙන අතර විවේක ගැනීමට පැමිණියේ කොච්චිකඩේ පල්ලියට යි.

එවකට ශ්‍රී ලංකාවේ වතිකානු තානාපති ඔස්පදෝ පසිල්ලා හිමිපාණන් සහ එවකට කොළඹ අගරදගුරු නික්ලස් මාකස් හිමිපාණන් ද සමඟින් උන්වහන්සේ එසේ පැමිණ තිබෙනවා.

2019 අප්‍රේල් 21 දා සිදුවූ පාස්කු බෝම්බ ප්‍රහාරයේ මුල්ම බෝම්බය පිපිරුණේ කොච්චිකඩේ පල්ලිය තුළ යි. එදින උදෑසන 8.45ට බෝම්බය පිපිරී ගියා.මාරාන්තික පිපිරීම සිදු වන විට ජෝයි මරියරත්නම් පියතුමා දෙමළ බසින් යාඥා කිරීමට නියමිත ව තිබුණා. බෝම්බයෙන් කොච්චිකඩේ පල්ලියට පැමිණ සිටි 54 දෙනෙකුට ජීවිත අහිමි වුණා. පල්ලිය කෙටිකලකින් ම ආරක්ෂක හමුදාවල සහායෙන් ප්‍රතිසංස්කරණය කෙරුණා. ප්‍රාණ පරිත්‍යාගීලින් වෙනුවෙන් ඔවුන්ගේ නම් සටහන් කළ පලකයක් ද පල්ලියේ ස්ථාපිත කර තිබෙනවා.

## කොටහේන සාන්ත ලූසියා දේවස්ථානය

1760 දී කොටහේන ශාන්ත ලූසියා දෙව්මැදුර ආරම්භ කරනකොට තිබුණේ පොල් අතු මඩුවකි. අද අපි දකින මේ පල්ලියේ හැඩරුව හැදෙන්න ගත්තේ 1937 වගේ කාලවලදීය. අද වන විට කොළඹ ඇති විශාලම දෙව්මැදුර වන්නේද මෙයයි. රෙනේසන්ස් සහ බාරෝක් ගෘහ නිර්මාණ ශිල්පය මේ පල්ලිය ඉදි කිරීමේදී උපයෝගී කරගෙන ඇත.





## වුල්වන්ඩාල් පල්ලිය



මෙම ගොඩනැගිල්ල ඉතා ආකර්ශණීය ගොඩනැගිල්ලක් නොවූවාට මෙය කොළඹ නගරයේ ඇති ඉපැරණීම ගොඩනැගිලිවලින් එකකි. පිටකොටුවේ වුල්වන්ඩාල් වීදියේ පිහිටා ඇති මෙම ගොඩනැගිල්ල අයත් වෙන්නේ ඩොරික් ගෘහ නිර්මාණ කලාවටයි. මෙහි බිත්ති බොහොමයක් අඩි පහක් විතර පළලට ඉතාම ශක්තිමත්ව නිර්මාණය කර තිබීම විශේෂත්වයකි.

ලන්දේසීන්ගේ පාලන යුගය වන විට මෙම ප්‍රදේශයේ බහුල වශයෙන් නරියන් ගැවසී ඇති බව වාර්තාවී ඇති මෙම නරින් වෘකයන් විදිහට වරදවා හඳුනා ගත් යුරෝපීයයන් මෙම ප්‍රදේශය හඳුන්වා ඇත්තේ වුල්වන්ඩාල්

(Wolvendaal) නැතිනම් වෘක පළාත ලෙසය. වෘක පළාතේ ඉදිවුපල්ලියට වුල්වන්ඩාල් පල්ලිය යැයි නම් කොට ඇත.

17 – 18 වැනි සියවස්වලට අයත් මේස, බංකු ඇතුළු ලී භාණ්ඩ තවමත් මේ පල්ලිය ඇතුළේ සුරැකිව තිබෙන අතර 1620 - 1936 යන කාල වකවානුවල මෙම දේවස්ථානයේ ලියාපදිංචි කරන ලද විවාහයන් සහ බෞතීස්ම කිරීම්වල වාර්තා මෙහි ලේඛනාගාරයේ අදටත් දැක ගත හැකි වේ. අද වන විටද දේව මෙහෙයන් පැවැත්වෙන මේ පල්ලියේ ලිපි ලේඛන නෙදර්ලන්ත රාජකීය තානාපති කාර්යාලයේ අනුග්‍රහය යටතේ අදටත් සංරක්ෂණය කෙරේ.

## සිවන් කෝවිල



වර්තමානයේ අතිශය ජනාකීර්ණ පෙදෙසක් වන එහි පරිසරය කලබලකාරීය. මේ අතිශය කලබලකාරී ඝෝෂාකාරී පරිසරයේම දහසක් ජනතා ප්‍රාර්ථනා ගොනු වූ තවත් ආගමික සංහිඳක් දැකිය හැකිය. ඒ මෙරට හින්දු බැතිමතුන්ගේ ප්‍රධාන පුදබිමක් වන ශ්‍රී පොන්නම්බලම් වානේෂ්වරර් දේවාස්ථානම් නම් වූ පුදබිමයි. එය පොදු ජනතාව අතරෙහි ප්‍රචලිතව ඇත්තේ ‘සිවන් කෝවිල් ’ නමිනි. සිංහල දමිල දෙපිරිසම කිසිදු භේදයකින් තොරව දේවාර්ශිවාද පතා පැමිනෙන සිවන් කෝවිල වනාහි කළුගලින් නිර්මාණය කරන ලද මෙරට සුවිසල්ම කෝවිල බව කියැවේ.

මෙයට වසර 144 කට පෙර මෙරට ජීවත් වූ පොන්නම්බලම් මුදලිවරයා මෙහි ආදි නිර්මාතෘය. ඔහු පූජනීය ස්ථාන වැඳපුදා ගැනීමේ අදහසින් ඉන්දියාවේ කල සංචාරය මෙහි මූලාරම්භයට හේතු වී ඇත. ශිව දෙවියන් උදෙසා කොලඹ නගරයේ කෝවිලක් තැනීමේ අදහස ඔහුගේ සිත තුල ඇතිවූයේ ඉන්දියාවේ රාමේශ්වරමේදී බව පැවසේ. ඉන්දියාවේ සිට පැමිණි ඔහු ඉන් අනතුරුව වත්මන් කෝවිල පිහිටි ස්ථානයේම වර්ෂ 1856 දී ගඩොලින් කෝවිල තැනීම ඇරඹීය. ගඩොල් බැඳීමට හුනු, වැලි හා මී පැණි මිශ්‍ර බදාමයක් භාවිතා කෙරිනි. වර්ෂ 1857 වනවිට එහි සියළු වැඩ අවසන් කර කුම්භාභිශේකම්(කොත පැලඳවීමේ) උත්සවය පවත්වා කෝවිල බැතිමතුන්ට විවෘතකර ඇත.

## රතු පල්ලිය





පිටකොටුවේ දෙවන හරස් වීදියේ පිහිටා තිබෙන ජෙම් උල් අල්ෆර් මුස්ලිම් දේවස්ථානය ආකර්ෂණීය ගොඩනැගිල්ලකි. කොළඹ නගරය වටා වසර දහස් ගණනක පටන් මුස්ලිම් ජනතාව සෙසු ජාතීන් සමඟ සහජීවනයෙන් ජීවන රටා පවත්වාගෙන යති.

මුල් වතාවට අරාබි මුස්ලිම් වෙළෙඳ නෞකාවක් මෙරටට පැමිණියේ කුළුබඩු සහ වෙනත් වටිනා ද්‍රව්‍ය සොයා ගෙනය. මේ අතර පිටකොටුව ආශ්‍රිතව ගුදමක් ආරම්භ කිරීමට ඔවුහු කල්පනා කළහ.පිටකොටුව ප්‍රදේශයේ මුස්ලිම් ජාතීන්ගේ වර්ග තුනක් වෙසෙති. ඔවුහු ශ්‍රී ලාංකේය මුස්ලිම්, ඉන්දියන් මුස්ලිම් සහ ජාවා වශයෙනි.ජාවා යනු මැලේසියාව මුල් කර ගත් මැලේ ජාතිකයන්ය.මැලේ ජාතිකයන් මෙරටට පැමිණියේ ලන්දේසි යුගයේදී ය. ඔවුන්ගේ සම්ප්‍රදායන් සහ ඉතිහාසය සෙසු මුස්ලිම් ප්‍රජාව 1909 වසරේ ඔවුන්ගේ යාඥා කටයුතු වෙනුවෙන් මෙම පල්ලිය ඉදි කරන ලදී. ජෙම් උල් අල්ෆර් මුස්ලිම් දේවස්ථානයේ රතු සහ සුදු ඉරි මගින් මුස්ලිම් සංස්කෘතියේ අනන්‍යතාව ඉස්මතු වේ.

පිටකොටුව ප්‍රදේශයේදී රතු පල්ලිය වෙත සෑම දෙනාගේම අවධානය යොමු වීම අරුමයක් නොවේ. මේ ගොඩනැගිල්ලට යොදා ඇති වර්ණ රටාව ඒ තරමටම විචිත්‍රවත් නිසාය. විවිධ සමාජ හැලහැප්පීම් අතර රතු පල්ලිය නිරුපද්‍රිතව පැවතීම මහත් භාග්‍යයක් ලෙස මුස්ලිම් බැතිමත්හු සලකති. මුස්ලිම් ප්‍රජාවගේ ආගම ඇදහීමේ කටයුතු වෙනුවෙන් විශාල මෙහෙයක් කරන රතු පල්ලිය පිටකොටුවට එන මුස්ලිම් බැතිමතුන්ගේ සිය යාඥා කටයුතුවලට විශාල පහසුවක් සලසයි. යාඥා කාලයේදී සහ සිකුරාදා දිනයන්හි මුස්ලිම් නොවන අයට රතු පල්ලියට ඇතුළුවීමට අවසර නොමැති මුත් අන් අවස්ථාවන්හී එම තහනම ක්‍රියාත්මක නොවේ.



## කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ වූ සෞන්දර්යාත්මක ස්ථාන

### නෙලුම් කුලුණ

නෙළුම් කුළුණ (නැතහොත් කොළඹ නෙළුම් කුළුණ) , ශ්‍රී ලංකාවේ, කොළඹ නගරය තුල ඉදි කර ඇති 2019/09/16 දින නිළ වශයෙන් විවෘත කරන ලද මීටර 350 ක් උසැති කුළුණක් වන අතර, මෙය නෙලුම් පොහොට්ටුවක හැඩ ඇති නිසා "නෙලුම් කුලුණ" ලෙස නම් කෙරේ.

## ගෝල්ලේෆ්ස් හෙවත් ගාලු මුවදොර

අපේ රටේ කොළඹ යැයි කියූ පමණින්ම අපට අද සිහිවන්නේ මුළු කොළඹම ලෝකයා හමුවේ තැබූ ඒ ගාලු මුවදොර පිටියයි. එසේත් නැත්නම් අපි හොඳින්ම දන්නා හඳුනන ගෝල්ෆේස් පිටියයි.ගෝල්ෆේස් පිටියට ඉතා දිගු අපූරු ඉතිහාසයක් තිබේ. එය අතීතය තුළ තුරඟ තරග පිටියක් ලෙසින් භාවිත කළ බව අදටත් ප්‍රසිද්ධ වූ රහසකි. එමෙන්ම ගාලු මුවදොර වරෙක වධකාගාරයක්ද විය. ඊට හේතුව එම පිටියේ ඉංග්‍රීසි හමුදාවේ යුද සෙබළකු එල්ලා මරා දැමීමට ඉදිකළ එල්ලුම් ගසයි. එමෙන්ම එදා සමාජයේ ඉහළ පැලැන්තියේ සිටි මිනිසුන් ගාලු මුවදොර නැත්නම් ගෝල්ෆේස් පිටිය තමන්ගේ ව්‍යායාම් කටයුතු සඳහාද යොදාගත් බව සඳහන් වෙයි. තවද අද මෙන්ම එදාද මේ ගාලු මුවදොර යනු සංචාරකයන්ගේ අපූරු පාරාදීසයකි. මේ අතර තවත් සුවිශේෂී හේතුවක් නිසාවෙන්ද ගාලු මුවදොර පිටිය අපට වැදගත්ය. එනම් මැයි පළමු වැනිදාට යෙදෙන ලෝකයම සමරන ජාත්‍යන්තර කම්කරු දිනය නිසාය. ඒ අනුව එදා ලංකා ඉතිහාසයේ කළ පළමු මැයි රැලිය 1933 වර්ෂයේදී කොළඹ ප්‍රයිස් පිටියෙන් ආරම්භ වූ අතර එය අවසන් කර තිබෙන්නේ ගාලු මුවදොර පිටියෙනි. එය ලංකා ඉතිහාසයේ සිදු වූ ඉතා වැදගත්ම සිදුවීමක් ලෙස සඳහන් කළ හැකිය.




## කොළඹ වරාය නගරය

කොළඹ ගාලු මුවදොර පිටියට ආසන්න මුහුදේ හෙක්ටයාර 269ක ප්‍රමාණයක් ගොඩකරමින් ඉදිකිරීමට අපේක්ෂිත නව වරාය නගරයකි. මුහුද ගොඩ කරමින් ශ්‍රී ලංකාව තුළ ප්‍රථම වරට ඉදිකරන වරාය නගරය ලෙස ද මෙය ඉතිහාසයට එක් වේ. නව කොළඹ දකුණු වරායේ දක්ෂිණ මායිම සහ කොටුව ප්‍රදීපාගාරය අතර කලාපයේ මෙම නව වරාය නගරය ඉදිකිරීමට අපේක්ෂිත වේ.



## පිටකොටුව පාවෙන වෙළඳපොළ

පිටකොටුව පාවෙන වෙළඳපොල ශ්‍රී ලංකාවේ කොළඹ අවට ප්‍රදේශයක් වන පිටකොටුවේ බැස්ටියන් මාවතේ පිහිටා ඇති අතර වෙළඳ කුටි 92 කින් සමන්විත වන අතර බේරේ වැවේ බෝට්ටු මත ස්ථාපිත වෙළඳ කුටි ගණනාවක් ඇත.



පාවෙන වෙළෙඳපොළ දේශීය නිෂ්පාදන සහ දේශීය හස්ත කර්මාන්ත අලෙවි කරන සංචාරක ආකර්ෂණයක් ස්ථානයක් ලෙස හැඳින්විය හැක. නාගරික සංවර්ධන අධිකාරිය මගින් පාවෙන වෙළෙඳපොළ සංවර්ධනය සහ අලංකරණ කටයුතු සඳහා දරණ ලද මුදල රු. මිලියන 150 කි. ශ්‍රී ලංකා යුද හමුදාවේ ඉංජිනේරු ඒකක නාගරික සංවර්ධන අධිකාරිය සමඟ එක්ව පිටකොටුව මධ්‍යම බස් නැවතුම්පොළ සහ කොළඹ කොටුව දුම්රිය ස්ථානය යා කරන වීදිය වන බැස්ටියන් වීදිය හරිත පරිසරයක් බවට පත් කරන ලදී. ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් බැස්ටියන් වීදිය අසලින් දිවෙන දූෂිත ඇළ ප්‍රතිසංස්කරණය කරන ලදී. තුෂාරි කාරියවසම් විසින් නිර්මාණය කරන ලද අළු සිමෙන්ති තට්ටු සහ අවම අලංකරණයෙන් යුත් ඇළ දිගේ ඇති කුටිවල අද්විතීය සරල ගෘහ නිර්මාණ ශිල්පය, වැවේ සන්සුන් හා නොකැළඹෙන ජලය පිළිබිඹු කිරීමට උත්සාහ කරයි.

## කොළඹ දුම්රිය කෞතුකාගාරය

රාජ්‍ය දෙපාර්තමේන්තු හා ආයතන ද අදවන විට තමන්ගේ දෙපාර්තමේන්තුවේ හා ආයතනයේ ඓතිහාසිකත්වයේ මතකයන් එකතු කරමින් කෞතුකාගාර ඉදිකර ඇත. මේ අතර දුම්රිය දෙපාර්තමේන්තු මගින් පවත්වාගෙන යනු ලබන දුම්රිය දෙපාර්තමේන්තු කෞතුකාගාරය අතිශය වැදගත් ය. යටත් විජිත සමයේ ආරම්භ වූ දුම්රිය දෙපාර්තමේන්තුව ලංකාවට ගෙන ආ මුල්ම ගල් අඟුරු දුම්රියේ ඇන්ජිමේ සිට වර්තමානය දක්වා ආ ගමන් මගේ විශේෂිත මතකයන් ඒකරාශි කර ඇත. මෙම සුවිශේෂ කෞතුකාගාරය ඕල්කෝට් මාවතෙහි පිහිටා ඇත.

## කාක දූපත වෙරළ උද්‍යානය

කැලණි ගං මෝයට මායිම් වේ. උද්‍යාන කඩොලාන, වගුරු බිම් සහ වෙරළබඩ වෘක්ෂලතාවලින් පුරසාරම් දොඩයි. බොහෝ අවන්හල්, ඇවිදීමේ මංතීරු සහ පාපැදි ධාවන පථ සමඟ විවේක ගැනීමට, ඇවිදීමට සහ විනෝද වීමට එය කදිම ස්ථානයකි.



## ආර්. ප්‍රේමදාස ක්‍රීඩාංගණය

ආර්. ප්‍රේමදාස ක්‍රීඩාංගණය ඛෙත්තාරාම ක්‍රීඩාංගණය, රණසිංහ ප්‍රේමදාස ක්‍රීඩාංගණය හෝ සරල ලෙසින් ප්‍රේමදාස ක්‍රීඩාංගණය ලෙසින්ද හැඳින්වෙයි) යනු, ශ්‍රී ලංකාවේ, කොළඹ, මාලිගාවත්තේ, ඛෙත්තාරාම පාරෙහි පිහිටි ක්‍රිකට් ක්‍රීඩාංගණයකි. ආරම්භයේදී මෙය ඛෙත්තාරාම අන්තර්ජාතික ක්‍රිකට් ක්‍රීඩාංගනය ලෙස ලෙස හැඳින්වූ අතර වර්ෂ 1994 දී මෙය ආර්.ප්‍රේමදාස අන්තර්ජාතික ක්‍රිකට් ක්‍රීඩාංගනය ලෙස නම් කරන ලදී. මෙහි ඇති විශේෂත්වය වන්නේ මෙම ක්‍රීඩාංගනය ආසියාවේ ඉදිකරනලද ප්‍රථම දිවා-රාත්‍රී ක්‍රිකට් තරඟ පැවැත්විය හැකි ක්‍රීඩාංගනය වීමයි. දැනට ක්‍රීඩාංගනයට යාබදව තණ තීරු 16 කින් යුත් පුහුණු මධ්‍යස්ථානයක් ආරම්භ කර තිබේ. සෝනි මැක්ස් ක්‍රිකට් ඇකඩමිය සඳහා නේවාසිකාගාරයක්ද සහිත එය 2003 දී ආරම්භ විය. 2011 ක්‍රිකට් ලෝක කුසලාන තරඟාවලිය සඳහා මෙය නවීකරනය කරනු ලැබූ අතර නරඹන්නන් 30000ක් සඳහා ඉඩ පහසුකම්ද නවීන තාක්ෂණයෙන් යුතු බහුමාධ්‍ය කුටි, ක්‍රීඩාගාර ආදිය ඇතුලත් කරන ලදී.



| ස්මාරකය | පිහිටා ඇති ස්ථානය | ඉදිකළ වසර |
|---|---|---|
| ජනාධිපති මන්දිරය - කොටුව | ජනාධිපති මාවත කොටුව | ක්‍රි.ව.1785 |
| ගෝර්ඩන් උද්‍යානය | ජනාධිපති මාවත | ක්‍රි.ව.1813ට පෙර |
| ක්ලිෆන්බර්ග් නිවස | නාවික හමුදා මූලස්ථානය | ක්‍රි.ව.1796 |
| ඕලන්ද කොටු බැම්ම හා දොරටු | වරාය භූමිය | ක්‍රි.ව. 1676 |
| දොරටු පාලන මන්දිරය | වරාය පරිශ්‍රය | ක්‍රි.ව. 1730 |
| රේගු මන්දිරය (පැරණි කොමිෂන් සභා ගොඩනැගිල්ල) | වරාය පරිශ්‍රය | ක්‍රි.ව.1876 |
| ඕලන්ද බඩු ගබඩාව සාමුද්‍රික කෞතුකාගාරය | වරාය පරිශ්‍රය | ක්‍රි.ව.1670 පමණ |
| පෘතුගීසි ලාංඡනය කෙටූ ගල්පරය | වරාය පරිශ්‍රය | ක්‍රි.ව. 1815 පමණ |
| නිරිත දිග දියකඩනය | වරාය පරිශ්‍රය | ක්‍රි.ව. 1875 |
| නිරිත දිග දියකඩනයෙහි ප්‍රදීපාගාරය | වරාය පරිශ්‍රය | ක්‍රි.ව. 1875 |
| ඊසාන දිග දියකඩනය | වරාය පරිශ්‍රය | ක්‍රි.ව.1898 |
| පැරණි නියමු ස්ථානයේ ප්‍රදීපාගාරය | වරාය පරිශ්‍රය | ක්‍රි.ව.1885 |
| ඕලන්ද රෝහල | කැනල් රෝ පටුමග | ක්‍රි.ව.1700 පමණ |
| ශාන්ත පීතර දේවස්ථානය | කොටුව - පල්ලිය වීදිය | ක්‍රි.ව. 1680 |
| ග්‍රෑන්ඩ් ඔරියන්ටල් හෝටලය | යෝක් වීදිය | ක්‍රි.ව. 1832 |
| ප්‍රධාන තැපැල් හල | ජනාධිපති මාවත | ක්‍රි.ව.1891- 95 |
| ඔරලෝසු කණුව හා පදීපස්ථම්භය | චැතම් වීදිය | ක්‍රි.ව.1856- 57 |
| පැරණි මුරගෙය (රාජසිංහ කුටිය) | ජනාධිපති මාවත | ක්‍රි.ව. 1875 පමණ |
| පැරණි ජනරජ ගොඩනැගිල්ල | ජනාධිපති මාවත කෙළවර | ක්‍රි.ව. 1860 |
| පැරණි පොලිස් මූලස්ථාන ගොඩනැගිල්ල | ජනරජ චතුරශ්‍රය | ක්‍රි.ව. 1867 |
| පැරණි ප්‍රවෘත්ති දෙපාර්තමේන්තු ග්‍රාමාරක්ෂක මූලස්ථාන ගොඩනැගිල්ල | අංක 11, බාරොන් ජයතිලක මාවත | ක්‍රි.ව. 1850 පමණ |
| පැරණි ගුවන් සමාගම් ගොඩනැගිල්ල | අංක 10/12, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත | ක්‍රි.ව.1786 |

| | | |
|---|---|---|
| පැරණි වයිට් අවේස් ගොඩනැගිල්ල | බාරොන් ජයතිලක මාවත | ක්‍රි.ව. 1905 -08 |
| ස්මාරකය | පිහිටා ඇති ස්ථානය | ඉදිකළ වසර |
| පැරණි ලාල්වාන්ඩ්ස් කඩ කාමරය | වැතම් වීදිය | ක්‍රි.ව. 1815 පමණ |
| ජුම්මා මුස්ලිම් පල්ලිය | වැතම් වීදිය | ක්‍රි.ව.1850 පමණ |
| පැරණි අලෙවි සංවර්ධන ගොඩනැගිල්ල | අංක 62, වැතම් වීදිය | ක්‍රි.ව.1878 |
| පැරණි `ද මැල් ගොඩනැගිල්ල´ | අංක 103, වැතම් වීදිය | ක්‍රි.ව.1901 |
| පැරණි මැකිනන් මැකන්සි ගොඩනැගිල්ල | ලේඩන් බැස්ටියන් මාවත | ක්‍රි.ව.1860 |
| පැරණි ෆෝර්ට්ලන්ඩ් ගොඩනැගිල්ල (කලම්බු හවුස්) | අංක 53/4, බාරොන් ජයතිලක මාවත | ක්‍රි.ව. 1901 |
| පැරණි මැතිව්ස් ගොඩනැගිල්ල | අංක 23, කැනල් රෝ පටුමග | ක්‍රි.ව.1896 |
| පැරණි චාටඩ් බැංකු ගොඩනැගිල්ල | ජනාධිපති මාවත | ක්‍රි.ව. 1892 |
| පැරණි හැටන් නැෂනල් බැංකු ගොඩනැගිල්ල | ජනාධිපති මාවත | ක්‍රි.ව. 1901 |
| ට්‍රාන්ස්වර්ක් මන්දිරය | ලෝටස් පාර, වැතම් වීදිය, යෝර්ක් වීදිය යාවන ස්ථානය | ක්‍රි.ව.1908 |
| පැරණි ඕස්ට්‍රෙලියා ගොඩනැගිල්ල | යෝක් වීදිය | ක්‍රි.ව. 1899-900 |
| පැරණි කාගිල්ස් හා මිලර්ස් ගොඩනැගිල්ල | යෝක් වීදිය | ක්‍රි.ව. 1844 |
| ලොයිඩ්ස් ගොඩනැගිල්ල | අංක 13, බාරොන් ජයතිලක මාවත | ක්‍රි.ව. 1908 |
| පැරණි ප්‍රින්ස් ගොඩනැගිල්ල (බී ඕ අයි) | අංක 14, බාරොන් ජයතිලක මාවත | ක්‍රි.ව. 1909 |
| පැරණි ගපූර් ගොඩනැගිල්ල | බාරොන් ජයතිලක මාවත | ක්‍රි.ව. 1907 |
| මාකන් මාකර් ගොඩනැගිල්ල | අංක 33, යෝක් වීදිය | ක්‍රි.ව. 1910 |
| ටෙලිකොම් මූලස්ථාන ගොඩනැගිල්ල | සී ටී ඕ, ලෝටස් පාර | ක්‍රි.ව. 1910 |
| නැෂනල් මුෂුවල් ගොඩනැගිල්ල | වැතම් වීදිය | ක්‍රි.ව. 1911 |
| පැරණි වෝකර්ස් ගොඩනැගිල්ල (ඖෂධ සංස්ථාවට අයත්) | | ක්‍රි.ව.1912 |
| පැරණි දුම්රිය පොල | ජස්ටින් අක්බාර් මාවත, කොම්පඤ්ඤ වීදිය. | ක්‍රි.ව. 1877 |

| | | |
|---|---|---|
| පැරණි නිපොන් හෝටලය | කුමාරන් රත්නම් පාර, කොම්පඤ්ඤ වීදිය. | ක්‍රි.ව. 1884 |
| ගාලු මුව දොර සක්මන ( මාපනේ දොරටුව) | | ක්‍රි.ව. 1840 - 60 |
| ක්‍රිස්තු දේවස්ථානය හා වික්ටෝරියා මැසනික් දෙව්සත් හල | අංක 60, මාකන් මාකාර් මාවත | ක්‍රි.ව. 1853 |
| ශාන්ත ඇන්ඩෲ දේවස්ථානය (ස්කොට් කීර්ක්) | අංක73, ගාලු පාරට යටින් දිවෙන දුම්රිය පාලම අසල | ක්‍රි.ව. 1907 |
| ස්මාරකය | පිහිටා ඇති ස්ථානය | ඉදිකළ වසර |
| මරදාන කාර්මික විද්‍යාල ගොඩනැගිල්ල | ඕල්කට් මාවත, (ශාන්ත බස්තියන් කන්දෙයි) | ක්‍රි.ව.1903 |
| කොළඹ පර්යන්ත  දුම්රිය පොල | ඕල්කට් මාවත කෙලවර, දුම්රිය කෞතුකාගාරයත් බේරේ වැවත් අතර | ක්‍රි.ව.1858 - 65 |
| මරදාන දුම්රිය පොල | මරදාන | ක්‍රි.ව. 1906-08 |
| ටවර් රඟහල | මරදාන | ක්‍රි.ව. 1911 |
| පිටකොටුව පැරණි බෝධිය | පිටකොටුව | ක්‍රි.ව. 1850 එපිට |
| කොළඹ පැරණි නගර ශාලාව සහ එඩින්බරෝ වෙළඳ පොල | ගැස් පහ හන්දිය | ක්‍රි.ව. 1870 |
| ඕල්කට් නිවස හා පාසැල හා පරම විඥාර්ථ බෞද්ධ සමාගම | අංක 54, මැලිබන් වීදිය | ක්‍රි.ව.  1881-85 |
| කයිමන් දොරටුව හා සන්ධාර කුළුණ | ගැස් පහ හන්දිය | ක්‍රි.ව. 1760 |
| කදිරවේළු කෝවිල | පළමු හරස් වීදිය | ක්‍රි.ව. 1900 පමණ |
| ජාමි උල් අල්ෆාර් පල්ලිය | දෙවන හරස් වීදිය | ක්‍රි.ව. 1908 |
| ඕලන්ද කෞතුකාගාරය | කුමාර වීදිය | ක්‍රි.ව. 1692 |
| ගෑස් සහ ජල සමාගම් ගොඩනැගිලි | බෝධිරාජ මාවත | ක්‍රි.ව. 1872 |
| පළමු සැතපුම් කණුව | වෙල්ල වීදිය, බුලත් කඩේ හන්දිය, අංක 40, ව්‍යාපාරික ස්ථානය අසල | ක්‍රි.ව. |
| මෙතෝදිස්ත දේවස්ථානය | වෙල්ල වීදිය | ක්‍රි.ව. 1816 |
| කොඩිගහ (පූර්වයෙන් ගල්බොක්ක ස්ථානයේ) | අලුත් කඬේ උසාවිය ඉදිරිපිට | ක්‍රි.ව. 1988 පෙර |
| පැරණි ශ්‍රේධාධිකරණ ගොඩනැගිල්ල | හල්ෆ්ට් ඩොෆ් | ක්‍රි.ව. 1655 |
| සියලු සාන්තුවරුන්ගේ දේවස්ථානය | හල්ෆ්ට් ඩොෆ් වීදිය | ක්‍රි.ව. 1895 |

| | | |
|---|---|---|
| දීපදුත්තාරාමය | කොටහේන | ක්‍රි.ව.1745 |
| ශ්‍රී රාමනාදන් කෝවිල (සිවන් කෝවිල) | කොටහේන | ක්‍රි.ව.1857 |
| වුල්ෆැන්ඩාල් දේවස්ථානය | ශ්‍රී රතනජෝති සරවනමුත්තු මාවත, කොටහේන | ක්‍රි.ව. 1749 |
| පරමානන්ද පුරාණ විහාරය | පරමානන්ද විහාර මාවත, කොටහේන | ක්‍රි.ව. 1833 |
| ශාන්ත ලුසියා දේවස්ථානය | කොටහේන | ක්‍රි.ව. 1760 |
| ශාන්ත අන්තෝනි දේවස්ථානය | කොටහේන | ක්‍රි.ව. 1860 |
| ශාන්ත තෝමස් දේවස්ථානය | ජින්තුපිටිය | ක්‍රි.ව. 1815 |
| මිරින්දාරාමය | අලුත් මාවත, මෝදර | ක්‍රි.ව. 1833 |